සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම : ............................................ නාට්‍ය හා රංග කලාව - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

I පහත දැක්වෙන ගායනාවන් ආශ්‍රයෙන් අංක 1 - 4 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) -
බෝමා ජාති ඇත බෝවී
මෙම ගඟ තුළ සැම තැන මාළු
අද මගෙ හේතුව හරි නැහැ අම්මප
කිසිම මාළුවෙක් කැවේ නැහැ ඇම

(ii) -
මේ ගම් පියසේ හේනේ මාමලා
කොච්චර හිටියත් මං වගෙ වෙන නැත
රජ වාසලෙන් සළු පිළි අරගෙන
යන්නෙමි රජු වඩිනා පෙරමුණයට

(iii) -
අසාලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා කිව්වෙ බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවේ අපහට දෝසයක්
කපාලා දෙමිය ගම මහගෙ බරට ගාතයක්

(iv) -
අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙළන්නී
තෝඩු දමන්නී පවලං මාල බඳින්නී
සේල අඳින්නී පටකින් ඔමරි දමන්නී

1. උඩරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයක ගැයෙන කවියක් සඳහන් වන්නේ
(1) i ය (2) ii ය (3) iii ය (4) iv ය

2. නාඩගම් සම්ප්‍රදායෙන් රඟ දැක්වෙන නූතන නාටකයක ගැයෙන ගායනාවක් දැක්වෙන්නේ
(1) i ය (2) ii ය (3) iii ය (4) iv ය

3. උඩරට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක් ගායනාවකි.
(1) i ය (2) ii ය (3) iii ය (4) iv ය

4. පහතරට ගැමි නාටකයකින් උපුටාගත් ගායනයකි.
(1) i ය (2) ii ය (3) iii ය (4) iv ය

5. වේදිකා නාට්‍යයක මූලික ලක්ෂණයක් නොවන්නේ
   (1) සජීවී ශ්‍රව්‍යදෘෂ්‍ය කලාවක් වීම
   (2) රූපණය කළ හැකි අවස්ථා පමණක් තෝරා ගැනීම
   (3) සීමිත අවකාශයක් භාවිතා කිරීම
   (4) ගබඩා කර තබාගත හැකිවීම

6. ප්‍රාසංගික කලාවක් නොවන්නේ
   (1) මුද්‍රා නාට්‍ය හා බැලේ රංගය
   (2) ඔපෙරා නාට්‍ය හා සංගීත කලාව
   (3) ගීත නාට්‍ය හා නර්තන කලාව
   (4) සිනමාව හා ටෙලි නාට්‍ය

7. නෘත්‍ය යනු
   (1) ශෝභමාන දෘශ්‍ය රූපයක් සහිත තාලාන්විත නැටුමකි.
   (2) අංග වික්ෂේප භාවිතා කරන භාවයක් දක්වෙන නැටුමකි.
   (3) කිසිදු අර්ථයක් නොදක්වෙන ලී කෙළි කළගෙඩි වැනි නර්තනාංගයකි
   (4) අංග වික්ෂේප භාවිතා කරන රිද්මයානුකූල නැටුමකි.

8. රූපණය යනු
   (1) ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන අවස්ථාවක් ඉදිරිපත් කිරීමකි
   (2) චරිතයකට ආරෝපණය වී කිසියම් කාලසීමාවක් එම චරිතය තුළ ජීවත් වීමයි
   (3) චරිතයක අභ්‍යන්තරය අවබෝධ කර ගැනීමයි
   (4) චරිත දෙකක් අතර සිදුවන ක්‍රියාවක් හා ප්‍රතික්‍රියාවකි.

9. රංග භූමියක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ
   (1) සමතලා භූමියක් වීම
   (2) රඟ පෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම
   (3) පසුතල ඉදි කිරීමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම
   (4) ප්‍රේක්ෂකයාට පහසුවෙන් රැස් වී සිටිය හැකිවීම

10. චලන අභ්‍යාසවලදී නිර්මිත චලන යනු
   (1) තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරනු ලබන චලනයන්ය.
   (2) එදිනෙදා ජීවිතයේ දී ආයාසයෙන් තොරව සිදු කරන චලනයන්ය.
   (3) නිශ්චිත රටාවකට අනුව බෙදා වෙන්කල ක්‍රමයකට සිදු කරනු ලබන චලනයන්ය.
   (4) නිදහසේ සිදු කරනු ලබන චලන රටාවන්ය.

11. රංග ක්‍රීඩාවන්හි අරමුණක් නොවන්නේ
   (1) ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම
   (2) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව දියුණු කිරීම
   (3) සබකෝලය දුරු කිරීම
   (4) පරිකල්පන ශක්තිය දියුණු කිරීම

**අංක 12 - 15 තෙක් ප්‍රශ්නවලට නොගැළපෙන පිළිතුර තෝරන්න.**

12. නාට්‍ය අධ්‍යක්ෂවරයා සතු වගකීම් වනුයේ
   (1) තම නාට්‍යයට සුදුසු නළු නිළියන් තෝරා ගැනීම
   (2) නාට්‍යය සඳහා විචාරයක් සැපයීම
   (3) නළු නිළියන් සමඟ නාට්‍ය පිටපත සාකච්ඡා කිරීම
   (4) ආනුශාංගික කලා ශිල්පීන් තෝරා ගැනීම.

13. නාට්‍ය ධර්මී ලක්ෂණයන්ය.
   (1) රථයක නැඟී යන බව නළුවන් විසින් අභිනයෙන් නිරූපණය කිරීම
   (2) එක් නළු කණ්ඩායමක් සිටින වේදිකාවට, තවත් නළු කණ්ඩායමක් පැමිණීමෙන් වේදිකාව කක්ෂ්‍යා දෙකකට වෙන්වීම
   (3) එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යන බව ඇඟවීමට නළුවා වේදිකාවේ වටයක් යෑම
   (4) නළු නිළියන් ගමන්තාල භාවිතා නොකිරීම.

14. පාසලේ දී නාට්‍ය හා රංගකලාව විෂය හැදෑරීමෙන්
   (1) ශිෂ්‍යයාගේ සබකෝලය දුරු කර ගැනීමට හැකිවේ.
   (2) ශිෂ්‍යයාගේ අධ්‍යාපන කටයුතු අඩාල වේ.
   (3) ශිෂ්‍යයාගේ ආත්ම විශ්වාසය වර්ධනය වේ.
   (4) ශිෂ්‍යයාගේ පෞරුෂ වර්ධනයට රුකුලක් වේ.

15. අංග රචනය සැම විටම
   (1) නළුවාගේ මුහුණ අලංකාර කිරීමට යොදා ගැනේ
   (2) නාට්‍යයේ රංග ශෛලියට අනුරූප විය යුතුය
   (3) චරිතයේ වයස හැඟවීමට සමත් විය යුතුය
   (4) සාත්ි්වික අභිනය තීව්‍ර කිරීමට උපකාරී වේ.

**I අංක 16 35 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

16. කොහොඹා කංකාරිය උපත් කථාවේ එන චරිතයන්ය
   (1) විජය, කුවේණි (2) රාම, සීතා (3) විජය, සීතා (4) රාම, කුවේණි

17. කොහොඹා කංකාරි ප්‍රථම වරට පවත්වන ලද්දේ
   (1) දේවානම්පියතිස්ස රාජ සමයේ දීය. (2) පඬුවස් දෙව් රාජ සමයේදී ය.
   (3) රාජාධිරාජ සිංහ රජ සමයේදීය (4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ සමයේ දීය.

18. කොහොඹා කංකාරියේ දී පුද ලබන දෙවිවරුන් ය
   (1) දෙවොල් දෙවියන්ය (2) සූනියම් දෙවියන්ය (3) බණ්ඩාර දෙවියන්ය (4) ගම්බාර දෙවියන්ය

19. ශ්‍රී ලංකාවේ මඩු ශාන්තිකර්ම කීපයකි.
   (1) දෙවොල් මඬුව, නාඩගම් මඬුව (2) පූණා මඩුව, බලි මඬුව
   (3) පහන් මඬුව, හැල්ලුම් මඬුව (4) ගී මඩුව, කෝලම් මඬුව

20. දෙවොල් කුමාරවරු සත්දෙනා ගොඩ බසින ලද්දේ
   (1) සීනිගමට ය (2) රත්ගමට ය (3) මතුගමට ය (4) රාගමට ය

21. කොහොඹා කංකාරිය සහ මඩු ශාන්තිකර්ම රඟ දක්වන ප්‍රදේශ අනුපිළිවෙළින් දක්වෙන්නේ
   (1) සත් කෝරළය, සතර කෝරළය, මාතර, ඇහැළියගොඩ
   (2) සත් කෝරළය, සතර කෝරළය, රත්නපුරය, කුරුවිට
   (3) සත් කෝරළය, සතර කෝරළය, ඔලබොඩුව, මිරිස්ස
   (4) සත් කෝරළය, සතර කෝරළය, උඩු දුම්බර, හේවාහැට

22. ''සොකරි'' යන්නෙන් අර්ථවත් වන්නේ
   (1) මහළු කාන්තාව (2) රූමත් කාන්තාව (3) ප්‍රභූ කාන්තාව (4) ගැමි කාන්තාව

23. සොකරි රංගයෙහි එන චරිතයක් නොවන්නේ
   (1) වෙදරාළ (2) ආඬිගුරු (3) පරයා (4) චුක්කිනියා

24. කෝලම් සහ සොකරි රංග භූමි, හැඳින්වෙන්නේ ........................... නමිනි.
   (1) කමත සහ කරලිය (2) කරලිය සහ තානායම්පොල
   (3) කරලිය සහ කමත (4) තානායම්පොල සහ කමත

25. ''වෙස් අත්ත'' දැකිය හැකි වන්නේ
   (1) කමතෙහි ය (2) කරලියෙහි ය (3) තානායම්පොළෙහි ය (4) යාග භූමියෙහි ය.

26. කෝලම් රංගයෙහිදී භාවිතා නොවන අභිනය වන්නේ
   (1) ආංගික අභිනය (2) සාත්ත්වික අභිනය (3) වාචික අභිනය (4) ආහාර්ය අභිනය

27. සොකරි සහ කෝලම් රංගනයෙහි දී දැකිය හැකි පොදු ලක්ෂණයක් නොවන්නේ
(1) වෙස් මුහුණු භාවිතය
(2) ස්ත්‍රී භූමිකාවක් පිරිමින් විසින් රඟ දැක්වීම
(3) රාත්‍රි කාලයේ දී රඟ දැක්වීම
(4) එකම කථා පුවතක් පාදක කර ගැනීම

28. නාඩගම් කලාවේ පියා ලෙස හැඳින්වෙන්නේ
(1) ආබ්‍රෙව් රාජපක්ෂ (2) ක්‍රිස්තියන් ප්‍රේරා (3) පිලිප්පු සිංඤෝ (4) එයාරිස් ද සිල්වා

29. නාඩගම් සඳහා භාවිතා වන වාද්‍ය භාණ්ඩයකි.
(1) තබ්ලාව (2) මද්දලය (3) උඩැක්කිය (4) තම්මැට්ටම

30. දික්තල කාලගෝල නාට්‍ය මුල්වරට නිෂ්පාදනය කරන ලද්දේ
(1) 1975 (2) 1976 (3) 1985 (4) 1986

31. දික්තල කාලගෝල නාට්‍යයේ දික්තලාගේ මව්පියන්ගේ නම් සඳහන් වරණය වන්නේ
(1) දන්තවූල හා චූල දන්තීය
(2) චමරී හා කයිදා ය.
(3) කිරි සන්දු හා සෙම්බරිය ය.
(4) හේතුපානි හා දික් සුරඹිය.

32. රංගභූමි ආලෝකකරණයේ දී එක් නළුවෙකු විශේෂ කර දැක්වීම සඳහා භාවිතා කරන්නේ
(1) ධාරා පහනයි (2) යොමු පහනයි (3) ක්ෂණ පහනයි (4) වර්ණ චක්‍රයයි

33. අංග රචනයේදී නළුවාගේ මුහුණ ප්‍රධාන වශයෙන් කලාප .......................... ට බෙදා දක්වයි.
(1) 5 (2) 6 (3) 4 (4) 7

34. නිෂ්පාදන පිටපත සකස් කරනු ලබන්නේ
(1) පෙළ රචකයා විසිනි
(2) අර්ථපති විසිනි
(3) අධ්‍යක්ෂවරයා විසිනි
(4) වේදිකා පාලක විසිනි

35. අංග රචනයේදී භාවිතා වන ද්‍රව්‍යයක් නොවන්නේ
(1) ලයිනිං කලර්ස් (2) ට්‍රූත් එනමල් (3) අයි ෂැඩෝ (4) බයින්ඩර් ගම්

**I පහත ඡායාරූප ඇසුරින් අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


ක


ග


ජ


ට


ඩ

36. හුණුවටයේ කථාව නාට්‍යයේ ග්‍රෑෂාගේ චරිතයට රංගනයෙන් දායක වූයේ
(1) ක (2) ග (3) ජ (4) ට

37. තාරාවෝ ඉගිලෙති නාට්‍යයට රංගනයෙන් දායකවූයේ
(1) ක (2) ජ (3) ට (4) ඩ

38. 1976 නිෂ්පාදනය වූ සෙක්කුව නාට්‍යයේ නිර්මාණකරුවා
(1) ක (2) ග (3) ජ (4) ඩ

39. ''හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්'' ගීතය සහිත නාට්‍යයේ නිර්මාණකරුවා
(1) ක (2) ග (3) ට (4) ඩ

40. මකරා, අහස් මාළිගා, ඇත්ත කුමක් ද යන පරිවර්තන නාට්‍ය නිර්මාණකරුවා
(1) ක (2) ජ (3) ට (4) ඩ

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

50 S II

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 11 - 2019

නම : ............................................ නාට්‍ය හා රංග කලාව - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

I පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

01. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍යයේ රංග ශෛලිය කුමක් ද? ලකුණු 02

(ii) මෙම නාට්‍යයේ එන චරිත 04ක් නම් කරන්න. ලකුණු 02

(iii) දික්තල කාලගෝල නාට්‍යයේ මුල් පිටපත කාගේ නිර්මාණයක් ද? ලකුණු 02

(iv) දික්තලා කාලගෝල ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු 02ක් සඳහන් කරන්න. ලකුණු 02

(v) මෙහි එන ගැටලුව විසඳීමට මහෞෂධ පඬිතුමා යොදා ගන්නා උපක්‍රමය කුමක් ද? ලකුණු 02

(vi) මෙම නාට්‍යයේ දික්තලාගේ හා කාලගෝලගේ චරිත රඟපාන ශිල්පීන් දෙදෙනා නම් කරන්න. ලකුණු 02

02. (i) ප්‍රාසාංගික කලා යනු කුමක්දැයි නිර්වචනය කරන්න. ලකුණු 02

(ii) ප්‍රාසාංගික කලා 04ක් නම් කරන්න. ලකුණු 04

(iii) සෙසු ප්‍රාසාංගික කලා අතර නාට්‍ය කලාවේ සුවිශේෂතාව විස්තර කරන්න. ලකුණු 06

03. (i) වේදිකා ආලෝකකරණය සඳහා යොදා ගන්නා ආලෝක පහන් වර්ග 02ක් නම් කරන්න. ලකුණු 02

(ii) ආලෝකකරණයේ දී ආලෝකකරණ ශිල්පියා හා සම්බන්ධ වන අනෙකුත් ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. ලකුණු 04

(iii) අඳුර පලවා හැරීම හැරුණකොට රංගාලෝකය භාවිතයෙන් නාට්‍යයට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි විස්තර කරන්න. ලකුණු 06

04. (i) වේෂ භූෂණ යනු කුමක්දැයි පැහැදිලි කරන්න. ලකුණු 02

(ii) වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න. ලකුණු 04

(iii) නාට්‍යයකට වේෂභූෂණ යොදාගැනීමේ වැදගත්කම පහදන්න. ලකුණු 06

05. (i) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි නාටක වර්ග 02 සඳහන් කරන්න. ලකුණු 02

(ii) ඉන් උඩරට සම්ප්‍රදාය නියෝජනය කරන ගැමි නාටකයේ කථා පුවත කෙටියෙන් ලියන්න. ලකුණු 04

(iii) පහතරට සම්ප්‍රදාය නියෝජනය කරන ගැමි නාටකයේ පූර්ව රංගයේ එන ස්ථාවර පාත්‍රයන් තුළින් එකල සමාජයේ අකටයුතුකම් පෙන්වා දී ඇති අයුරු පහදන්න. ලකුණු 06

06. පහත සඳහන් කථා සැකිල්ල උපයෝගී කරගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

කුඩා කල සිටම මව නොමැතිව තම පුතා හදාවඩා ගන්නා සියාතු උසස් අධ්‍යාපනයෙන් පසු එංගලන්තයට ගිය තම පුතු එනතුරු හැම දිනකම දැස් දල්වා බලා හිඳීම පුරුද්දක් කරගෙන සිටී. දහවල කෙටි නින්දකට වැටී සිටි ඔහුට තම පුතු විත් දොරට තට්ටු කරන හඬ ඇසී දොර හැර බැලූ විට ......

(i) සංවාද රංග විධාන සහිත පෙළ නිර්මාණයට ලකුණු 04

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම ලකුණු 04

(iii) දෙගිඩියාව, උත්ප්‍රාසය හා කුතුහලය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම ලකුණු 04

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 S I - II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

### නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (4) | 11. | (1) | 21. | (2) | 31. | (4) |
| 2. | (1) | 12. | (2) | 22. | (2) | 32. | (2) |
| 3. | (3) | 13. | (4) | 23. | (4) | 33. | (2) |
| 4. | (2) | 14. | (2) | 24. | (4) | 34. | (2) |
| 5. | (4) | 15. | (1) | 25. | (3) | 35. | (4) |
| 6. | (4) | 16. | (1) | 26. | (2) | 36. | (3) |
| 7. | (2) | 17. | (2) | 27. | (4) | 37. | (3) |
| 8. | (2) | 18. | (3) | 28. | (3) | 38. | (4) |
| 9. | (3) | 19. | (3) | 29. | (2) | 39. | (2) |
| 10. | (1) | 20. | (1) | 30. | (1) | 40. | (1) |

### II කොටස

01. (i) නාට්‍ය ධර්මී රංග ශෛලිය (02)

(ii) දික්තලා, කාලගෝල, දික්පිටියා, මහෞෂධ පඬිතුමා වත්තු දත්ත (02)

(iii) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේගේ (02)

(iv) විරූපී නිසා තමන්ගේ ගෙදර බැලමෙහෙවර කළ නිසා අඟුටු මිට්ටෙක් නිසා, දෙදෙනාගේ අදහස් නොගැළපෙන නිසා (02)

(v) තිදෙනා වෙන් වෙන් වශයෙන් ගෙන පෞද්ගලික තොරතුරු විමසීම (02)

(vi) දික්තලා - මැණිකේ අත්තනායක, මාධනී මල්වත්ත
කාලගෝල - රිචඩ් මානමුදලි } (02)

02. (i) ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් සජීවී ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රංග භූමියක් මත ඉදිරිපත් කරන නිරූපණය ප්‍රාසාංගික කලාව ලෙස හැඳින්විය හැක. (02)

(ii) නර්තන ප්‍රසංග, සංගීත ප්‍රසංග, බැලේ, ඔපෙරා, මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය (04)

(iii)
- සතර අභිනය භාවිතය
- අනුශාංගික අංග සුසංයෝගය
- හරවත් කථා තේමාවක් ඇතුළත් වීම
- උපදේශයක් ලබාදීම
- සජීවී ප්‍රේක්ෂක සම්බන්ධතාව යනාදී කරුණු තුනක්වත් විස්තර කිරීම සඳහා (06)

03. (i) ධාරාලෝක පහන්
යොමු පහන්
ආලෝක බුබුළු වැට
අල්ට්‍රා වයලට් පහන්
හැලජන් පහන් ආදී .... 02ක් නම් කිරීමට (02)

(ii) 1. පසුතල නිර්මාණ ශිල්පියා
2. වේෂ භූෂණ ශිල්පියා
3. අංග රචනා ශිල්පියා... දෙදෙනෙක් නම් කිරීමට (04)

(iii)
- භාව ප්‍රකාශනය තීව්‍ර කිරීම
- අර්ථය උද්දීපනය කිරීම
- චරිත විශේෂ කිරීම
- අංක මාරු කිරීම
- පසුතල මැවීම
- පසුතල ස්ථානගත කිරීම... ආදී කරුණු 03ක්වත් විස්තර කර ඇත්නම් (06)

04. (i) වේෂ භූෂණ යනු නළු නිළියන් භාවිතා කරන ඇඳුම් පැළඳුම්ය. (02)

(ii) 1.අර්ථය උද්දීපනය විය යුතුය
2. නාට්‍යයෙන් කියවෙන කාලයට දේශයට යුගයට උචිත විය යුතුයි.
3. පහසුවෙන් ඇඟලා ගැනීමටත් ඉවත් කිරීමටත් හැකි විය යුතුයි.
4. අඩු වියදම් සහිත විය යුතුයි.
5. සැහැල්ලු විය යුතුයි. (04)

(iii) ! අර්ථය ඉස්මතුකර දැක්වීම
! නළුවාට සමාරෝපය වීමේ පහසුව
! චරිත ස්වභාවය ඉස්මතු කිරීම
! ප්‍රේක්ෂක ආකර්ශණය දිනා ගැනීම
! නාට්‍ය විචිත්‍රවත් කිරීම ... ආදී කරුණු 03ක් වත් විස්තර කර ඇත්නම් (06)

05. (i) සොකරි - උඩරට සම්ප්‍රදාය
කෝලම් - පහතරට සම්ප්‍රදාය (02)
එක් සාධකයක් පිළිබඳ විස්තර ලියා ඇත්නම් (02)

(ii) සොකරි නාට්‍යයේ කථා පුවත විස්තර කර ඇත්නම් (04)

(iii) 1. අණ බෙර කෝලම - තම රාජකාරිය පැහැර හැර මත්ද්‍රව්‍ය ගැනීම
2. ජසයා - සේදීමට එකතු කරගත් රෙදි උකසට තබා මත්ද්‍රව්‍ය භාවිතය
3.ලෙන්චිනා හා පුරන්සිනා - දෙදෙනාගේ අමනාපකම් නිසා රාජකාරිය නොසලකා සේදීමට ගෙනා රෙදි නොසැලකිල්ලෙන් සේදීම
4. ආරච්චි - රාජකාරිය පක්ෂග්‍රාහීව කිරීම
5. මුදලි - ස්ත්‍රීන්ට ඇති ලොල් බව නිසා රාජකාරිය පැහැර හැර පක්ෂග්‍රාහීව කටයුතු කිරීම
ආදී කරුණු තුනක් ඇසුරින් විස්තර කර ඇත්නම් (06)

06. දී ඇති කථා සැකිල්ල උපකාර කරගෙන

(i) සංවාද රංග විධාන සහිත පෙළ නිර්මාණයට (04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ නිර්මාණය කිරීමට (04)

(iii) දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (04)